දෙමාපියනි,වැඩිහිටියනි,
පහත ඡේදය දරුවන්ට ඇසෙන සේ ශබ්ද නගා කියවන්න.

පබසර, සමනලගේ හොඳම යහළුවා. හැමදා ම පබසර සවසට සමනලගේ ගෙදර යනවා. සමනලගේ අම්මා වත්ත පුරා ලස්සනට මල් වවලා. මල් පඳුරු අතර ලොකු හබරල පඳුරක් තිබුණා. හබරල පඳුර ළඟ තිබුණු ටයරය ඇතුළේ වතුර පිරිලා තියෙනවා පබසර දැක්කා . අර බලන්න සමනල, ටයරය ඇතුළේ වතුර. ඩෙංගු මදුරුවෝ බෝ වෙයි. සමනල කලබල වුණා. මේ ටයරයට වැලි පුරවලා තියමු. එතකොට වතුර පිරෙන්නේ නැහැ. මතක ද අපට ගුරුතුමී කියා දුන්නා. සමනලත්, පබසරත් ටයරයට වැලි පිරෙවුවා.

දුවේ පුතේ,

- මෙහි ඉරි ඇඳි වචන කියවන්න

පබසර සමනල සවසට හබරල ටයරය කලබල

මෙම ඉරි ඇඳි වචන ලියන්න.

1- .....
2- .....
3- .....
4- .....
5- .....
6- .....